ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශන වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූල්‍ය නොවන වත්කම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 තුළ හඳුනාගෙන ඇති ඉඩම්වල ප්‍රමාණය හෙක්ටයාර 24 ක් ලෙස තක්සේරු කර ඇති අතර එහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ (ACA-P) මූල්‍ය නොවන වත්කම් යටතේ රු.මිලියන 559 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අයත් රු.මිලියන 23 ක් වටිනා ඉඩම්වල අයිතිය අත්පත් කර ගැනීම සඳහා වසර 5 කට වැඩි කාලයක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක ඉඩම් පවරාදීම පිළිබඳ කටයුතු පසුගිය අවුරුදු 3 ක සිට සිදුකරමින් පවතී.	කඩිනම් පියවර ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ට අයත් ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, 2015 ට පෙර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 තුළ රජයේ ව්‍යාපෘති සංවිධාන විසින් විවිධ වැඩසටහන් හරහා රජයේ ඉඩම් 678 ක් සහ පෞද්ගලික ඉඩම් 94 ක් තුළ ඉදිකර සම්පූර්ණයෙන්ම භාර දුන් පොදු උපයෝගිතා ගොඩනැගිලි 772 සහ රජයේ ඉඩම් සම්බන්ධයෙන් වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක SA/GFS/01/01/General දරන 05.02.2025 දිනති ලිපිය අනුව අදාළ තොරතුරු ලබාගෙන, තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර එය විධිමත් ගිණුම්වල සටහන් කිරීමට අදාළ කටයුතු සිදුකරමින් පැවති.	ඉඩම් අයිතිය පවරාගෙන තක්සේරු කරවාගෙන ගිණුම්ගත කිරීමටත්, ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් පියවර ගත යුතුය.

2 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු 1.6.1(අ) ඡේදයේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නිරීක්ෂණය		ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 05 වන වගන්තිය සහ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2016 ජූනි 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	රජයේ නිලධාරීන්ගේ නිල නිවාස භාවිතය සඳහා අය කරනු ලබන කුලිය, රජයේ සේවයේ නියුතු යුවළක් රජයේ නිල නිවාසවල ජීවත් වන විට එම නිලධාරියාගේ වැටුපෙන් 10% ක් සහ ඔහුගේ කලත්‍රයා රජයේ නිලධාරියෙකු නම් කලත්‍රයාගේ වැටුපෙන් සියයට 2½ ක් විය යුතුය. කෙසේ වෙතත්, 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිල නිවාසයක පදිංචි වී සිටි නිලධාරියෙකුගේ කලත්‍රයාගෙන් වැටුපෙන් සියයට 2½ ක කුලිය ගණනය කර අයකර ගෙන නොතිබුණි.	ආයතන සංග්‍රහයේ XIX ඡේදයේ 5වැනි වගන්තිය අනුව පරිපාලන චක්‍රලේඛ 4/2016 අනුව 5.4 සහ 5.4.1 වගන්තිවල සිදු කර ඇති සංශෝධන අනුව බලයලත් නිලධාරියාගෙන් 12.5%ක් අයකරන අතර කලත්‍රයාගෙන් 2.5%ක් අයකිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් පැහැදිලිකම විමසා ඇත.	ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ අනුව නිවැරදි නිල නිවාස කුලිය අයකිරීමට අදාළ කටයුතු සිදු කළ යුතුය.

(ආ) **රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

(i)	2008 අගෝස්තු 14 දිනැති අංක 06/2008 දරන චක්‍රලේඛයේ 04 වන වගන්තිය	2024 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම්වරයාට වෙන් කර ඇති වාහනය සඳහා අනුමත කරන ලද ලීටර් 245 ක මාසික ඉන්ධන දීමනාවට අමතරව, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2024 වර්ෂයේ ගමන් කළ කිලෝමීටර් 18,720 ක දුර ප්‍රමාණය සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන ලීටර් 3,552 ක් මිලදී ගැනීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රු.1,219,711 ක මුදලක් ගෙවා තිබුණි.	අමතර ඉන්ධන වියදම් ලබාගැනීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගත යුතුය. නමුත් මේවනතෙක් මෙම ක්‍රියාවලිය පිළිනොපැදි හේතුවෙන් අදාළ අනුමැතිය ලබාගෙන නොමැති බව දැනුම් දෙන අතර ඉදිරියේදී ඉහත අනුමැතිය අදාළ පරිදි ලබාගන්නා බව කාරුණිකව දැනුම් දෙමි.	අනුමැතියකින් තොරව ලබාගත් ඉන්ධන සඳහා දරා ඇති වියදම වගකිව යුතු නිලධාරියාගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	2013 ඔක්තෝබර් 07 දිනැති චක්‍රලේඛ අංක 21/2013 සහ 2021 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛ අංක 15/2021	නිවාඩු දින රාජකාරිය ඉටු කළ යුත්තේ කුමන දිනයේදීද, කුමන ආකාරයේ රාජකාරියක් ඉටු කළ යුතුද, එම රාජකාරිය දෛනික රාජකාරිවලට අමතරද සහ ඒ සඳහා සත්‍ය වශයෙන්ම කොපමණ දින ගණනක් ගත වේද යන්න පිළිබඳ කිසිදු සැලසුමකින් තොරව නිවාඩු වැටුප් සඳහා අයදුම්පත් නිර්දේශ කර ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. එවැනි අයදුම්පත් සහ නිර්දේශ සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බවද නිරීක්ෂණය විය.	දැනට නිවාඩු දින වැටුප් අනුමැති ඉල්ලුම්පත්‍රය සංශෝධනය කර අදාළ අවධානය ගෙන අනුමැතිය ලබාදෙමින් පැවති.	නිවාඩු දින රාජකාරි අයදුම්පත්‍ර ඉල්ලීම, නිර්දේශ කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රමයක් විධිමත්ව සැකසිය යුතුය.

3.2 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කාන්තා හා ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ ඇති මඩකලපුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය	අදාළ නිලධාරියාගේ ඉල්ලුම පරිදි ලබාදුන් ගෙවීම්වලට අනුවර්තන අනුමැතිය ඉල්ලා	චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි ලබාදී ඇති ගෙවීම්

	කළ ගණකාධිකාරීවරයෙකුට 2023 අප්‍රේල් 27 සිට 2023 ඔක්තෝබර් 05 දක්වා කාලය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරීවරයෙකු ලෙස පූර්ණ කාලීනව වැඩබැලීමේ රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් රු.476,530 ක ඉන්ධන සහ ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. නිල වාහන වෙනුවට ඉන්ධන සහ මාසික ප්‍රවාහන දීමනාව ගෙවීම සම්බන්ධයෙන් වන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 සැප්තැම්බර් 07 සහ 2016 මාර්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2016 සහ 05/2016(1) අනුව, අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව සහ සේවකයා අදාළ තනතුරේ වැඩ බලන රාජකාරි (පූර්ණ කාලීනව) ඉටු කර ඇති බවට සාක්ෂි තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන කාර්ය සාධන තක්සේරුවකින් තොරව ඉහත ගෙවීම් සිදු කර තිබුණි.	අමාත්‍යාංශයට ලිපියක් එවා ඇත. අමාත්‍යාංශයේ උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.	සම්බන්ධයෙන් පරීක්ෂා කර බලය රහිත මෙම ගෙවීම නැවත අයකර ගැනීමත්, අදාළ පාර්ශව වෙත විධිමත් පියවර ගැනීමත් කළ යුතුය.
(ආ)	2024 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් දිස්ත්‍රික්කයෙන් පිටත සංචාර සඳහා අමතර ඉන්ධන ලීටර් 4,405 ක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, වසර තුළ දිස්ත්‍රික්කයෙන් පිටත සංචාර සඳහා ඉන්ධන ලීටර් 3,146 ක් පමණක් භාවිතා කරන ලදී. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.407,916 ක වටිනාකමැති අමතර ලීටර් 1,259 ක ඉන්ධන ලබා දී තිබුණි.	අමතර වශයෙන් ලබාදුන් ඉන්ධන ගෙවීම සම්බන්ධයෙන් අදාළ නිලධාරින්ගෙන් කරුණු විමසා ඇත. ඒ අනුව අමතර ඉන්ධන ප්‍රමාණය ගණන්කර අදාළ ගෙවීම් මුදල අය කරනු ලැබේ.	අමතර ඉන්ධන ප්‍රමාණයට අදාළ වටිනාකම ගණනය කර නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2023 සහ 2024 වර්ෂයන් තුළදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිල නිවසේ පිහිටා ඇති විදුලි උත්පාදක යන්ත්‍රය සඳහා පිළිවෙලින් ඉන්ධන ලීටර් 509 ක් සහ ලීටර් 408 ක් සඳහා ගෙවීම් කර තිබුණි. මෙහි වටිනාකම පිළිවෙලින් රු. 185,530 ක් සහ රු. 127,628 ක් වී තිබුණි. කෙසේ වෙතත්, මෙම ඉන්ධන පරිභෝජනයේ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා විගණනය වෙත අදාළ ලියකියවිලි ඉදිරිපත් කර නොතිබුණි.	ලබාදී ඇති ඉන්ධන භාවිතය සහ ගෙවීම් සම්බන්ධයෙන් අදාළ නිලධාරින්ගෙන් කරුණු විමසා ඇත. ඒ අනුව අදාළ නිලධාරින්ගෙන් ගෙවීම් මුදල අය කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.	ඉන්ධන උපයෝජනය හා ඊට දරා ඇති වියදම් තහවුරු කර ගැනීම සඳහා විගණනයට ඉල්ලූ ලේඛන හා තොරතුරු ලබා දිය යුතු අතර විධිමත් පරීක්ෂාවක් සිදු කර අවභාවිතාවක් සිදු වී ඇත්නම් විධිමත් පියවර ගත යුතුය.
(ඈ)	ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයට අනුව, කෝරලයිපත්තු මධ්‍යම සහ කෝරලයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කළමනාකරණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකුට පත්වීම් ලබා දී පිළිවෙලින් 2019 සැප්තැම්බර් 28 සිට 2023 මැයි 31 දක්වා සහ 2018 ජූලි 26 සිට 2023 ජුනි 02 දක්වා කාල සීමාවන් සඳහා වැඩ බැලීමේ දීමනාව ලෙස වැඩ බැලීමේ තනතුරේ ආරම්භක වැටුපෙන් සියයට 25 ක් ගණනය කර නිලධාරියා සේවය කළ	කොරළේපත්තු බටහිර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වැඩබලන පරිපාලන නිලධාරි ලෙස සේවය කර විශ්‍රාම ලබා සිටින අවස්ථාවක අමතරව ලබාදී තිබෙන ගෙවීම් මාසිකව නැවත ගෙවයි. කොරළේපත්තු මධ්‍යම ප්‍රාදේශිය ලේකම්	ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ලබාදී ඇති දීමනාව එම නිලධාරීන්ගෙන් නැවත අයකළ යුතු අතර, එම ගෙවීම් සිදු කළ පාර්ශව සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

කාලය සඳහා පිළිවෙලින් රු.455,079 ක් සහ රු.581,493 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම රාජකාරි සඳහා ගෙවීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:2 වගන්තියට අනුව සහ වැඩ බලන දීමනාව ගෙවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන අංශය විසින් 2019 අගෝස්තු 16 දින නිකුත් කරන ලද අංක ADM/INTCur/2018/2019 ලිපියට අනුව, රු.58,212 ක් සහ රු. 76,904 ක් පමණක් ගෙවීමට නියමිතව තිබුණි. ඒ අනුව, වැඩ බලන රාජකාරිය සඳහා පිළිවෙලින් රු.396,867 ක් සහ රු.504,589 ක් වැඩිපුර ගෙවීම් සිදු කරන ඇති බව නිරීක්ෂණය විය.	කාර්යාලයේ වැඩබලන පරිපාලන නිලධාරි ලෙස සේවය කළ නිලධාරියා දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවය කරන බැවින් මෙය අයකරන ලෙස අදාළ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.	

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රිකට් සංවර්ධන වැඩසටහන සඳහා කලාපීය කමිටුව විසින් තෝරාගත් නව පාසල් සහ දැනට ක්‍රිකට් ක්‍රීඩා කරන පාසල් 25කට ප්‍රමුඛත්වය දෙමින්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 34.351ක ප්‍රතිපාදන යටතේ ඉදිකිරීමට අවසර දී තිබූ ක්‍රිකට් ක්‍රීඩා පුහුණු පිටි සහ ක්‍රිකට් පුහුණු තණතීරු සම්බන්ධයෙන් පාසල් 15කට අදාළව සිදු කරන ලද භෞතික විගණනයකදී, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල තාක්ෂණික නිලධාරී සහ තාක්ෂණික සහකාර විසින් පරීක්ෂා කරන ලද ලේඛන සහ සංසන්දනාත්මක ඍජු ගණනය කිරීම සැසඳීමේදී පස් ඝන මීටර් 462.98 ක ප්‍රමාණයක් අඩුවෙන් දමා ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත්කරුවන්ට රු.1,973,590 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, කොන්ත්‍රාත්තුවේ දින දීර්ඝ කිරීම අනුව, එම කාර්යය 2024 දෙසැම්බර් 20 දිනට පෙර අවසන් කළ යුතු වුවත් 2025 පෙබරවාරි 20 විගණන දිනය වන විටත් සම්පූර්ණයෙන්ම නිම කර නොතිබුණු බැවින් ප්‍රමාද කාලය සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් රු.719,700 ක ප්‍රමාද ගාස්තු අයකරගෙන නොතිබුණි.	Comparative Statement හි තිබෙන ප්‍රමාණවලට අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් බොරළු ගෙනා ඒමේදි Hauling Measurement ගෙන පසුව Pile කර බොරළු දමා ඇත. මෙම වැඩකටයුතු කොන්ත්‍රාත්කරුවන් විසින් අවසන් කර 23.12.2024 දින ප්‍රමාණ පත්‍ර අප වෙත ඉදිරිපත් කර තිබුණේය. නමුත් එය පරීක්ෂා කිරීමට ගිය අවස්ථාවේ වැඩකටයුතු නිමා කර තිබුණත් සමහර නඩත්තු කටයුතු තිබුණ හේතුවෙන් ඒ සඳහා දඩ මුදල අයකිරීමට අවස්ථාවක් නොතිබුණු බව දන්වා ඇත.	විධිමත් පරීක්ෂණයක් පවත්වා ක්‍රීඩා පිටි 25ට අදාළ පස් පිරවීම ප්‍රමාණ ගණනය කර වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු අතර අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය.

4.2 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	''ජයන්තිපුරම් ග්‍රාම සංවර්ධන'' සංගමයේ සභාපතිවරයා මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු ලෙස සේවය කරනු ලබයි. ඔහු 2024 වර්ෂයේදී ''ජයන්තිපුරම් ග්‍රාම සංවර්ධන සංගමය'' වෙනුවෙන් මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු. 9,583,832 ක් වටිනා සිවිල් වැඩ 05 ක් සඳහා කොන්ත්‍රාත්තුව අත්සන් කර තිබුණි.	''ජයන්තිපුරම් ග්‍රාම සංවර්ධන'' සමිතියේ සභාපති වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරි ලෙස සේවය කරන බව කරුණ සම්බන්ධයෙන් සැලකිලිමත්කම අවශ්‍ය පරිදි ප්‍රකාශ කර තිබුණේ නැත. දැනට අප විසින් විමර්ශන කමිටුවක් පත්කර විමර්ශන පැවත්වෙන බැවින් පැවති. අදාළ විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු සිදුකරනු ලැබේ.	පවත්වන විමර්ශනය කඩිනම් කර ඒ මත අදාළ නිලධාරියා සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතුය.
(ආ)	2024 වර්ෂයේදී දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන හරහා කෝරලයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.මිලියන 78.6 ක මුදලක් වෙන් කර තිබුණි. 2006 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 1.2.1 මාර්ගෝපදේශයට අනුව , ප්‍රසම්පාදනයට සහභාගී වීමට සුදුසුකම් ලත් පාර්ශවයන්ට සාධාරණ හා සමාන අවස්ථා ලබා දීමෙන් තරඟකාරිත්වය මත කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමෙන් තොරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.මිලියන 46.9 ක් වටිනා වැඩ 18 ක් ප්‍රජාමූල සංවිධාන වෙත ප්‍රදානය කර තිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරියා විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවල අඩුපාඩු හේතුවෙන්, ඇස්තමේන්තුගත කටයුතු වෙනුවෙන් අමතර වැඩ සඳහා රු.1,564,652 ක මුදලක් ගෙවා ඇති බවද විගණනයේදී නිරීක්ෂණය විය.	අවම කාල සීමාව තුළ අදාළ ව්‍යාපෘති සම්පූර්ණ කළ යුතු තත්ත්වයක් ඇතිවූ තිබූ බැවින් වැඩකටයුතු කඩිනමින් සම්පූර්ණ කිරීමේ අරමුණින් සමාජ මූලික සංවිධාන කණ්ඩායම් විසින් ඉටුකරනු ලැබුණේය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තරඟකාරීත්වය තුළින් උපරිම ආර්ථික වාසි රජයට ගත හැකි පරිදි කොන්ත්‍රාත් ලබාදීමට කටයුතු සිදුකළ යුතුය.
(ඇ)	දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන හරහා 2024 වර්ෂයේදී වෙන් කරන ලද මිලියන 61.54 න් රු.30 ක මුදලක් කෝරලපත්තු දකුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ක්‍රීඩා පිටිය සංවර්ධනය සඳහා වෙන් කර තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 1.2.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර රු.මිලියන 25 ක මුදලකට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැඩ 12 ක් ප්‍රජාමූල සංවිධාන වෙත ප්‍රදානය කර තිබීම හේතුවෙන්	මෙම සැලසුමට අදාළ වැඩකටයුතු තක්සේරු සියල්ලම කොරළේපත්තු උතුර ප්‍රාදේශිය සභාව විසින් සිදුකළ නිසා එය ක්‍රියාත්මක කරනු ලැබුණේය. නමුත්, වරින්වර මිල ගණන්වල සිදුවූ වෙනස්කම් හේතුවෙන් එම තක්සේරුව වෙනස් වී ඇති බව.	-එම-

තරඟකාරිත්වය තුළින් ලබා ගත හැකි මිල විකල්ප සහ ආර්ථික වාසි ලබා ගැනීමේ අවස්ථාව මගහැරී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

4.3.1 මූල්‍ය නොවන වත්කම් උපයෝජනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ට්‍රැක්ටරයක්, ජල බවුසරයක් සහ කෝරලයිපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ට්‍රැක්ටර්යක් සඳහා වාර්ෂික වාහන ආදායම් බලපත්‍ර වසර 01 සිට 07 දක්වා කාලයක සිට ලබාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.	මෙම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉන්වෙන්ටරි ලේඛනයේ තිබෙන ට්‍රැක්ටරය සහ බවුසර් රථය මහජන භාවිතය සඳහා ප්‍රාදේශිය සභාව වෙත ලබාදී ඇති බැවින් එය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර වහාම එය භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙනු ලැබේ.	නියමිත කාල සීමාවට අදාළව සියලුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගත යුතු අතර එසේ කටයුතු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය
(ආ)	කෝරළේපත්තු උතුර වාකරෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.600,000 ක් වටිනා ට්‍රැක්ටරයක් සහ රු.50,000 ක් වටිනා ට්‍රැක්ටර් ටේලරයක් කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව දිගු කාලයක් නිෂ්ක්‍රීයව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.	මෙම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉන්වෙන්ටරි ලේඛනයේ තිබෙන ට්‍රැක්ටරය සහ බවුසර් රථය මහජන භාවිතය සඳහා ප්‍රාදේශිය සභාව වෙත ලබාදී ඇති බැවින් එය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකර එය භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.	සියලු වත්කම් නිසි පරිදි පූර්ණ උපයෝජනයට කටයුතු කළ යුතුය.

4.4 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024 යටතේ මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්වේච්ඡා සංවිධාන දෙකකට රු. 5,942,156 ක් වටිනා භාණ්ඩ ලබා දී තිබුණි. 2015 සහ 2022 වසරවල ලියාපදිංචි කර ඇති මෙම ස්වෙච්ඡා සංවිධාන ක්‍රියාකාරී සංවිධාන බව තහවුරු කරගෙන නොතිබුණි. ලබා දී ඇති උපකරණ අතර රු. 2,125,200 ක් වටිනා නවීන කැමරා සහ උපකරණ ද පැවති අතර මෙම නවීන කැමරා සහ උපකරණවල අවශ්‍යතාවය තහවුරු කරගෙන නොතිබුණි.	මෙම ස්වේච්ඡා සංවිධාන 02ක දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කළ තිබූ අතර දැනට මෙම සංවිධාන දෙකම අදාළ ලිපින වල ක්‍රියාත්මක නොව වසා ඇති බව අපේ නිරීක්ෂණයේ තහවුරු කර ඇත. දැනට ලබාදී තිබෙන කැමරාවල අවශ්‍යතාව සහ භාවිතය පිළිබඳව පරීක්ෂා කර එය නැවත ලබාගැනීමට කටයුතු සිදුකර ඇත. මෙලෙස ලබාගත් භාණ්ඩ අවශ්‍යතා මත	විධිමත් පරීක්ෂාවක් සිදු කර අක්‍රීය සංවිධාන වෙත මේ අයුරින් භාණ්ඩ ලබා දුන් නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීමත් කැමරා සහ උපකරණ අරමුණට අනුව භාවිතා නොකරන්නේ නම් නැවත පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය.

		ඉල්ලුම්කරන සංවිධානවලට ලබාදීමට දිස්ත්‍රික් ලේකම්තුමාගේ අනුමැතිය සහ උපදෙස් ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.	

(ආ) නිරවුල් නොකළ තැන්පතු

(i)	මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආරයම්පති පොදු සුසාන භූමිය වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ලැබුණු රු.මිලියන 9.6 ක මුදල අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කර නොතිබූ අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය පියවර නොගෙන වසර 5 කට වැඩි කාලයක් එම මුදල් තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.	අදාළ ආරයම්පති පොදු සුසාන භූමිය වෙනුවෙන් ඉඩම් අත්පත් කිරීම සඳහා ලබාදුන් මිලියන 9.6ක මුදල පොදු තැන්පත් ගිණුමට බැර කර වියදම් කිරීමට අදාළ අනුමැතිය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදීම ඇති අතර අදාළ ඉඩම සම්බන්ධයෙන් නඩු පවරා තිබෙන බැවින් එය අත්පත් කර ගැනීමට නොහැකි බැවින් අදාළමුදල තැන්පත් ගිණුමේ බැර කර ඇත.	අදාළ කටයුතු කඩිනම් කර මුදල් රෙගුලාසි අනුව තැන්පත් මුදල් නිරවුල් කර ගත යුතුය.
(ii)	මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිවිසුම්ගත තැන්පතු යටතේ වසර 05 ඉක්ම වූ රු.26,355,774 ක තැන්පතු වටිනාකමක් පැවති අතර එයින් රු.9,360,840 ක වටිනා තැන්පතු වසර 07 කට වැඩි කාලයක් තැන්පතු ගිණුමෙහි රඳවා තිබුණි. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසි 571ට අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අදාළ තැන්පතු ගෙවීමට හෝ රජයේ ආදායමක් ලෙස ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ මුල් කොන්ත්‍රාත්කරු වන LINK ආයතනයට ගෙවිය යුතු රඳවුම් මුදලකි. අදාළ කොන්ත්‍රාත්කරුට එරෙහිව Arbitration ක්‍රියාත්මක වෙන වැබින් අදාළ රඳවුම් මුදල නැවත ගෙවීමට හෝ ආදායම් ගිණුමට ගැනීමට නොහැකි වී තිබේ.	රඳවා ගත් තැන්පතුවලට අදාළ කාර්යන් කඩිනම් කර තැන්පතු සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

5. යහපාලනය

5.1 විගණන හා කළමනාකරණ කමිටු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වන වගන්තියේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලැබුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කිරීම, කොන්ත්‍රාත්වල ප්‍රමාද ගාස්තු අය කිරීම, විගණන වාර්තාවලින් පෙන්වා ඇති කළමනාකරණ	විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල සාකච්ඡා කළ කොන්ත්‍රාත් වලට අදාළ ප්‍රමාද ගාස්තු මිලියන 57 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව විමර්ශන සිදුකරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ	අදාළ අඩුපාඩු සම්බන්ධයෙන් කඩිනම් තීරණ ගෙන ක්‍රියාත්මක කරවා ගැටළු නිරාකරණය කර ගත යුතුය.

	අකාර්යක්ෂමතාවයන් නිවැරදි කිරීම සහ 2019 වසරේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කමිටු රැස්වීමේදී ගනු ලැබූ තීරණ සහ ක්‍රියාත්මක කිරීම් සෑම කමිටු රැස්වීමකදීම සාකච්ඡා කළ ද වසර පහකට අධික කාලයක් ගත වී යනතුරුත් ගැටළු නිරාකරණය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.	ලේකම්තුමාට දැනුම් දී ඇත. නමුත් අදාළ කොන්ත්‍රාත්කරුට එරෙහිව Arbitation පැවතින බැවින් අදාළ නිලධාරියාට එරෙහිව විමර්ශන සිදුකිරීමට නොහැකිවී තිබෙන බව අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් උපදෙස් ලබාදී ඇත.	

5.2 පද්ධති හා පාලන

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී, නියමිත කාලය තුළ භාණ්ඩ, සේවා සහ කොන්ත්‍රාත් කටයුතු සම්පූර්ණ නොකර, ඇණවුම් කළ භාණ්ඩ හා සේවා ලබා නොගෙන, මුදල් රෙගුලාසි 136, 137, 138 සහ 139 ප්‍රකාරව බලතල ක්‍රියාත්මක කරන නිලධාරීන් සැපයුම්කරුවන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් සඳහා චෙක්පත් ලියා මාස තුනකට වැඩි කාලයක් ගෙවීම් නොකර සේප්පුවේ රඳවා තබා තිබුණි.	අදාළ පරිදි වැඩකටයුතු නිමාකිරීමෙන් තොරව කිසිඳු ගෙවීමක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් සිදු කරනු නොලැබේ. මහජන යහපතට ප්‍රමුඛත්වය ලබාදෙමින් මුදල් රෙගුලාසියේ ලබාදී තිබෙන බලය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ සේවා සැපයුම්කරුවන්ට සාපේක්ෂව භාවිතා නොකෙරේ. තවද ඔබ විසින් පෙන්වා දුන් කරුණු ඉදිරියේදී සැලකිල්ලට ගෙන මුදල් රෙගුලාසි වගන්ති 136, 137, 138 සහ 139 යටතේ පවරනු ලැබූ බලය විධිමත්ව පිළිපදින බවට උපදදෙස් ලබා දී ඇත.	මුදල් රෙගුලාසි විධිවිධාන වලට පටහැනිව කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 1687 ක් වන අතර සැබෑ සේවක සංඛ්‍යාව 2376 ක් විය. මේ අනුව, අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 50 ක් හෙවත් 841 කි. 2024 දෙසැම්බර් 31 වන විට, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ තනතුරු සඳහා පුරප්පාඩු 32 ක් සහ ද්විතීයික සහ ප්‍රාථමික නිලධාරීන්ගේ තනතුරු සඳහා පුරප්පාඩු 120 ක් තිබුණි.	අප දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අංක DMS/1205 දරන 07.11.2017 දිනැති ලිපිය මගින් සේවක සංඛ්‍යාව අනුමත කර ලබා දී ඇත.	කාර්ය මණ්ඩල සමාලොචනයක් සිදු කර අත්‍යාවශ්‍ය පුරප්පාඩු පමණක් පිරවීමටත්, අතිරික්ත සේවක සංඛ්‍යාව තුලනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් යෙදීමත් කළ යුතුය.

(ආ)	මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අනුමත විවිධ සංවර්ධන නිලධාරී තනතුරු සඳහා කාර්ය මණ්ඩලය 667 ක් වුවද, 2024 දෙසැම්බර් 31 වන විට එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරන අතිරික්ත කාර්ය මණ්ඩලය 833 කි. එබැවින්, අතිරික්ත කාර්ය මණ්ඩලය සියයට 125 ක් විය.	ඊට පසුව අමාත්‍යාංශය විසින් සිදුකළ පත්වීම් වලට අනුව අපට සේවක සංඛ්‍යාව අනුමත කර නොමැති අතර සංවර්ධන නිලධාරි පත්වීම් දිගටම ලබාදුන් හේතුවෙන් අපට අනුමත කළ සේවක සංඛ්‍යාවට අමතර සේවකයන් සිටිති. කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු පවතින ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල වැඩිපුර සිටින සංවර්ධන නිලධාරින් මගින් රාජකාරි ඉටුකරනු ලැබේ. අනුමත කර තිබෙන සංවර්ධන නිලධාරි සේවක සංඛ්‍යාව වැඩිකිරීම සඳහා අමාත්‍යාංශය වෙත ලිපි එවා ඇතත් ඒ සඳහා වන අනුමැතිය මේවනතෙක් ලැබී නැත.	අතිරික්ත සේවක සංඛ්‍යාව තුලනය කිරීම සඳහා විධිමත් කඩිනම් වැඩපිළිවෙලක් යෙදිය යුතුය.